සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- දී ඇති ස්ථානයේ ඔබගේ අංකය ලියන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවාද පිළිපදින්න.

(01) ඉස්ලාමීය විශ්වාසය ගොනු කර දීමට බිහිවූ කලාව කුමක්ද?
(1) ඉල්මුල් මීරාස් (2) ඉල්මුල් අකීදා (3) ඉල්මුල් ඊමාන් (4) ඉල්මුල් කුර්ආන්

(02) ඊමානයේ ඉතා පහලම අංගය ලෙස නබි (සල්) හඳුන්වාදෙන්නේ කුමක්ද?
(1) දෙමව්පියන්ට උපකාර කිරීම
(2) ජමාඅත් සමඟ පස්වේල් සලාතය
(3) මාර්ගයේ ඇති හානිදායක දේ ඉවත් කිරීම
(4) ලැජ්ජා සහගත ලෙස ජීවත් වීම

(03) ඉස්ලාමීය අකීදා අංශය ආරක්ෂා කිරීමට ඉදිරිපත් වූ විද්වතුන්ගෙන් ප්‍රධාන වූයේ කවුරුන්ද?
(1) ඉමාම් ෂාෆි (රහ්) (2) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල්
(3) ඉමාම් බුහාරි (රහ්) (4) ඉමාම් මුස්ලිම් (රහ්)

(04) අල්ලාහ්තආලා විසින් අල්කුර්ආනයේ ඊමානය හා එක්ව සඳහන් කරන අංශය කුමක්ද?
(1) පරලොව ජීවිතය (2) සලිහීන් වූ අමල් (3) දන්දීම (4) උපවාසය ඉටුකිරීම

(05) කබ්ර්, බෑස්, මහ්ෂර්, හිසාබ්, මීසාන්, හව්ල්, සිරාත්, ජන්නා, නාර් යන පරලොව ජීවිතය සමඟ සම්බන්ධ කරුණු අඩංගු අංගය කුමක්ද?
(1) අල් ඉලාහියියාත් (2) අන්නුබුවත් (3) අස්සම් ඉය්යාත් (4) අර් රූහානියාත්

(06) ඉස්ලාමීය අකීදාවට පදනම් වන්නේ කුමක්ද?
(1) අල්කුර්ආනය හා සුන්නාව (2) සුන්නාව හා කියාසය
(3) සුන්නාව හා ඉජ්මාව (4) අල්කුර්ආනය හා ඉජ්මාව

(07) නබිවරු අතරින් ආගම් හා සුහුෆ් පහළ වූ නබිවරයා කවුරුන්ද?
(1) දාවූද් (අලෛ) (2) හීද් (අලෛ) (3) ඉද්රීස් (අලෛ) (4) මූසා (අලෛ)

08) මහා කිලි ඇති අයෙක් පිරිසිදු වීමට කුමක් කළ යුතු ද?

(1) වුළු කිරීම (2) තයම්මුම් කිරීම (3) මිස්වාක් කිරීම (4) ස්නානය

(09) සලාතයේ ඉෆ්තිරාෂ් හිඳුම යනු කුමක්ද?

(1) අවසාන අත්තහියාත් ඉඳුම

(2) හිටගෙන සලාත් නොකල හැකි අය ඉඳගන්නා ආකාරය

(3) පළමු අත්තහියාත් ඉඳුම

(4) සලාම් දුන් පසු ඉඳගන්නා ආකාරය

(10) "මුස්ලිම්වරයෙක් දිනපතා ෆර්ලු සලාතයට පසු අල්කුර්ආනයේ එක් පාඨයක් පාරායනා කළවිට ඊළඟ සලාතය දක්වා අල්ලාහ්තආලාගේ ආරක්ෂාව යටතේ සිටී" යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූහ. එම කුර්ආන් පාඨය කුමක්ද?

(1) ආයතුත් තෙයින් (2) ආයතුල් කුර්සි

(3) සූරා ඉක්රාවෙහි පළමු ආයතය (4) සූරා යාසින්හි අවසාන ආයතය

(11) ශරීරයේ එක් මස් පිඩක් ඇත. එය නරක් වූ විට මුළු ශරීරයම නරක් වන බව නබි තුමාණෝ පැවසූහ. එය කුමක්ද?

(1) ඇස (2) මොළය (3) සිත (4) හදවත

(12) වරක් අරාබිකරයේ දැඩි සාගතයක් හා නියඟයක් ඇතිවීම නිසා දිර්හම් දාහක් වටිනා වස්තුව පරිත්‍යාග කළ සහබිවරයා කවුරුන්ද?

(1) අලි (රළි) (2) උමර් (රළි) (3) අබු බක්කර් (4) උස්මාන් (රළි)

(13) පිළිමයේ නාසය කැපූ නිසා තම නාසය කපා දැමීමට ඉදිරිපත් වූ අය කවුරුන්ද?

(1) අමර් ඉබ්නු ආස් (රළි) (2) මුස්අබ් ඉබ්නු උමර් (රළි)

(3) ඉබ්නු අබ්බාස් (රළි) (4) අබ්දුර් රහ්මාන් ඉබ්නු අවුෆ් (රළි)

(14) වරළ යන පදයෙන් කුමක් හඳුන්වයිද?

(1) පරාර්ථකාමිත්වය (2) පාරිශුද්ධ සිත (3) දේවභිය (4) පිළිවෙත් සුරැකීම

(15) අල්කුර්ආනය ක්‍රම ක්‍රමයෙන් පහළ කිරීමේදී එය සටහන් කරගත් අය හඳුන්වන්නේ කෙසේද?

(1) කුත්තාබුල් වහී (2) වහී මත්ලුව්වු (3) මුඅද්දිසීන් (4) මුෆස්සිරූන්

(16) අල්කුර්ආනය පාරායනා කරන පිළිවෙළ කෙසේ හැඳින්වේද?

(1) තර්තීබ් (2) තජ්විද් (3) තර්තීබුත් තිලාවත් (4) තර්තිබුත් නුසූල්

(17) නබි (සල්) තුමාගේ වෆාතයට පෙර රමළානයේ ජිබ්රීල් (අලෛ) තුමාණන් නබි (සල්) තුමාණන් සමඟ අල්කුර්ආනය දෙවතාවක් පරීක්ෂා කර ගත්හ. එවිට නබි තුමාණන් සමඟ සිටි සහාබිවරයා කවුරුන්ද?

(1) හුදෙයිබා (රළි) (2) සෙයිද් ඉබ්නු සාබිත් (රළි)

(3) ඉබ්නු අබ්බාස් (රලි) (4) සුබෙයිර් (රළි)

(18) උස්මාන් (රළි) තුමාගේ කාලයේ අල්කුර්ආනය පිටපත් කර බෙදා හැරීමේ අවශ්‍යතාවය කලීෆාතුමාට පහදාදුන් නබිතුමාගේ මිත්‍රයා කවුරුන්ද?

(1) අබුතල්හා (රළි) (2) මුආවියා (රළි)
(3) අලි (රළි) (4) හුදෙයිෆා අල්යමානි (රළි)

(19) ඉස්ලාමීය දෙවන නීති මූලාශ්‍රය කුමක්ද?

(1) මස්ලහා මුර්සලා (2) කියාස් (3) සුන්නා (4) ඉජ්මාඋ

(20) ඉස්ලාමීය සහායක මූලාශ්‍ර අතුරින් ප්‍රධාන ස්ථානය ලබාගන්නා සහායක මූලාශ්‍ර දෙක කුමක්ද?

(1) කුර්ආන් - සුන්නා (2) කුර්ආන් - හදීස්
(3) සුන්නා - උර්ෆ් (4) ඉජ්මාඋ - කියාස්

(21) ඉස්ලාමයට පෙර අරාබියාවේ තම තමන්ගේ ගෝත්‍ර වර්ධනයට ගෝත්‍ර හැඟීමෙන් කැපවූහ. එම ගෝත්‍ර හැඟීම හඳුන්වන්නේ කෙසේද?

(1) ශුඋඃබ් (2) අසබියියා (3) කබිලා (4) ඉල්මියියා

(22) උම්මහාතුල් මුඃමිනින්වරුන්ගෙන් දුල් වියා තම ජීවිකාව ගෙන ගියේ කවුරුන්ද?

(1) හෆ්සා (රළි) (2) ජුවෙයිරියා (රළි)
(3) ආයිෂා (රළි) (4) සෙනබ් බින්ත් ජහස් (රළි)

(23) සීරාව පිළිබඳ ග්‍රන්ථය ප්‍රථමයෙන් ලේඛන ගතකලේ කවුරුන්ද?

(1) මුහම්මද් බින් ඉස්හාක් (2) ඉබ්නු හියාම්
(3) ඉබ්නු මුහම්මද් (4) අබු අහ්මද

(24) දව හා ඇණ භාවිතයෙන් නැව නිපදවූ නබිවරයා කවුරුන්ද?

(1) හාරූන් (අලෛ) (2) නූහ් (අලෛ) (3) යුසුෆ් (අලෛ) (4) යහ්යා (අලෛ)

(25) තම තරුණ වියේදීම අරාබි ව්‍යාකරණ පිළිබඳව දස්කම් දැක්වූ කතෘ වරයා කවුරුන්ද?

(1) ඉමාම් බුහාරි (2) ඉමාම් ෂාෆි (3) ඉමාම් අහ්මද් (4) ඉමාම් ෂිබ්වෙහි

(26) 'බලසම්පන්න මුඃමින්වරයකු, බෙලහීන මුඃමින්වරයෙකුට වඩා ශ්‍රේෂ්ඨ වේ' අල්ලාහ්ට වඩාත් කැමති කෙනා වන්නේය' යනු

(1) නබිතුමාගේ වදනකි (2) අල්කුර්ආන් පාඨයකි
(3) සහාබාවරුන්ගේ වදනකි (4) ඉමාම්වරුන්ගේ වදනකි

(27) මිනිසුන් නොසැලකිලිමත් වන දායාදයන් දෙකක් පිළිබඳව නබි (සල්) තුමා අවධාරණය කළහ. එම දායාද දෙක කුමක්ද?

(1) විවේකය හා ආහාර (2) විවේක හා පිරිසිදුකම
(3) නිරෝගිකම හා විවේකය (4) නිරෝගිකම හා පිරිසිදුකම

(28) 'කන්න බොන්න අනවශ්‍ය ලෙස නාස්ති නොකරන්න' යනු

(1) හදීස් වේ (2) අල්කුර්ආන් වැකියකි
(3) ඉජ්මාවෙන් ලබා ගත් විසඳුමකි (4) කියාස් මගින් ලබාගත් විසඳුමකි

(29) වරක් නබි (සල්) තුමාගෙන් උසස් රැකියාව කුමක්ද? යනුවෙන් ඇසූ විට එතුමා පැවසූ පිළිතුර කුමක්ද?
(1) කෘෂි කර්මාන්ත හා අවංක වෙළඳාම
(2) වෙළඳාම හා කෘෂිකර්මාන්තය
(3) ව්‍යාපාර හා වෙළඳාම
(4) කෘෂි කර්මාන්තය හා ගොවිතැන

(30) පාරායනා කර පෙන්වූ වහී යනු කුමක්ද?
(1) සුන්නාහ්
(2) හදීස්
(3) අල්කුර්ආන්
(4) ඉබ්‍රාහීම් (අලෛ) දැකපු සිහිනය

(31) තිදෙනෙකුගේ ඇස් අපාය නොදකින බව නබි (සල්) තුමාණෝ පැවසූහ. මෙහි අඩංගු නොවන්නේ කවුරුන්ද?
(1) අල්ලාහ්ගේ යහ මගට නිදි මැරූ ඇස්
(2) අල්ලාහ්ගේ බිය බැතියෙන් හැඬූ ඇස
(3) අල්ලාහ් විසින් තහනම් කළ දෙය නොබැලූ ඇස්
(4) රාත්‍රිය හා දහවල පොත් කියවපු ඇස්

(32) ඔබ පස්වේල් සලාතය නොවරදවා ඉටුකරන මුස්ලිම්වරයෙකු ලෙස පස්වේල් සලාතය අයත් වන නීතිය වනුයේ කුමක්ද?
(1) ෆර්ලු අයින්
(2) ෆර්ලු කිෆායා
(3) වාජිබ්
(4) සුන්නා මු අක්කදා

(33) පහත සඳහන් කරුණු අතරින් පුරුෂයකුට විවාහ වීමට අනුමත අජ්නබි වන ස්ත්‍රිය කවුරුන්ද?
(1) මවගේ සහෝදරිය
(2) සහෝදරියගේ දියණිය
(3) පියාගේ සහෝදරියගේ දියණිය
(4) කිරි නෑකම අනුව සහෝදරිය

(34) ෆික්හුල් අව්ලවියාත් පිළිබඳ ඔබ දන්නා පහත සඳහන් ක්‍රියා අතරින් ප්‍රමුඛත්වය ලබා දෙන ක්‍රියාව කුමක්ද?
(1) නිවසේ කටයුතු සඳහා මවට උදව් වීම
(2) පාඩම නැවත මතක් කිරීම
(3) අල්කුර්ආනය කට පාඩම් කිරීම
(4) අනතුරට පත් වූ කෙනකු රෝහලට රැගෙන යාම

(35) 'අ' කොටසේ ඇති පද 'ආ' කොටසත් සමඟ නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර කුමක්ද?

| අ | ආ |
|---|---|
| i. රබ්බුල් ආලමීන් | A මනුෂ්‍යයන්ගේ ස්වාමියා |
| ii. රබ්බුන් නාස් | B මුළු මහත් මනුෂ්‍ය සමාජයටම නබි |
| iii. රහ්මතන් ලිල් ආලමීන් | C සර්ව දූතයා |
| iv. කාෆ්ෆතුන් ලින්නාස් | D සර්ව බලධාරියා |

(1) D, B, C, A
(2) B,C,D,A
(3) B,D,A,C
(4) D,A,C,B

(36) අවංක හා සත්‍යවාදී වෙළෙන්දා පරලොවේදී කවුරුන් සමඟ සිටීදැයි? නබි සල් තුමා පවසන ලද්දේ

(1) නබිවරු
(2) සිද්දීක්කීන්වරු
(3) ෂුහාදාවරු
(4) සියල්ලම නිවැරදි

(37) කලබලයෙන් හා නොසන්සුන් බවෙන් තොර තැන්පත් තත්වයෙහි දක්නට ලැබෙන සිත කෙසේ හඳුන්වයිද?

(1) නෆ්සුල් ලව්වාමා
(2) නෆ්සුල් මුත්ම ඉන්නා
(3)නෆ්සුල් අම්මාරා
(4) නෆ්සුන් බිස්සුඃ

(38) එක් හදීසයක නබි (සල්) තුමාණෝ සත්‍යවාදී බලසම්පන්න කෙනෙකුගේ ගුණාංගයක් මතු කර දැක්වූයේ ය. එම ගුණාංගය කුමක්ද?

(1) මලල ක්‍රීඩාවෙන් කෙනෙකු පරදවන්නා
(2) කෙනකු සමඟ වාද කර ජය ලබන්නා
(3) කෝපය හටගත් විට තම සිත පාලනය කරන්නා
(4) රෝගී අවස්ථාවල උපවාසය ඉටුකරන්නා

(39) කුල්ලතයින් ප්‍රමාණයේ ජලය කෙසේ හඳුන්වයිද?

(1) ලීටර් 210 වඩා අධික ජලය
(2) ලීටර් 205 වඩා අධික ජලය
(3) ලීටර් 200 වඩා අධික ජලය
(4) ලීටර් 110 වඩා අධික ජලය

(40) ඉමාරත් යනු,

(1) දෙවියන් නැමදීමේ කාර්යය
(2) භූමිය සරු කිරීම
(3) අල්ලාහ් නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම
(4) දෑවා සේවය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ඉස්ලාම් ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙකුත් එක් එක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින්ද හිමිවේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(1) අකීදාවට විරුද්ධ වූ කණ්ඩායම් දෙකක් සඳහන් කරන්න.

(2) කිලි වර්ග දෙක ලියන්න.

(3) අල්මාඋල් මුස්තඃමල් යනු කුමක්ද?

(4) මා ඔබලා වෙත කාරණා දෙකක් හැරයමි. එය ඔබ නිසියාකාරව අනුගමනය කරන තෙක් නොමග යන්නේ නැත. එය කුමක්ද?

(5) දාරුල් ෆනා, දාරුල් බකා යන දෙපදයේ අර්ථය කුමක්ද?

(6) ඉජ්මාඋ, කියාස් හැර සහායක මූලාශ්‍ර දෙකක් ලියන්න.

(7) ඉස්ලාමීය ආර්ථිකයේ සංකල්ප දෙක කුමක්ද?

(8) සේවා රැකියා හි කොටස් දෙක ලියන්න.

(9) වඩු කර්මාන්තය හඳුන්වාදුන් නබිවරයා කවුරුන්ද?

(10) වහි වර්ග හඳුන්වන්න.

(02) (i) මුස්ලිම්වරයකු තුන් ආකාරයක වගකීම් ඉටුකළ යුතුයි. එය කුමක්ද?

(ii) ඉබාදතයේ අරමුණු තුනක් ලියන්න.

(iii) මුස්ලිම්වරයකුගේ දෛනික ක්‍රියාකාරකම් ඉබාදත් බවට පත් වීමට අවශ්‍යකොන්දේසි පහ නම් කර කෙටියෙන් විස්තර කරන්න.

(03) (i) තස්කියා යන පදයේ අරාබි අර්ථයත්, භාෂා ව්‍යවහාර අර්ථයත් ලියන්න.

(ii) නුඹගේ සිත් පාරිශුද්ධ වීමට නම් කුමක් කරන්නේද? එම ක්‍රියා තුනක් සඳහන් කරන්න.

(iii) අල්කුර්ආනයේ සඳහන් වන සිතෙහි තත්වයන් තුන නම් කර කෙටියෙන් විස්තර කරන්න.

(04) (i) සීරා යනු කුමක්ද?

(ii) ඉපයීමේදී රැකියා යුතු නීති රීති තුනක් ලියන්න.

(iii) ඉස්ලාමීය ආර්ථිකයේ වැදගත් කරුණු පහක් ලියා කෙටියෙන් පහදන්න.

(05) (i) යකඩ භාවිතාකර විශාල බිත්ති බැඳීම හා අමුණු නිර්මාණය කිරීමේ කාර්යයෙහි යෙදී සිටි සෙන්පතියා කවුරුන්ද?

(ii) වෙළඳාමෙහි මූලික කරුණු තුන කවරේද?

(iii) වෙළඳාමේදී විකුණන්නා සහ මිල දී ගන්නා ඉස්ලාමීය සිද්ධාන්ත අනුගමනය කර වෙළඳාමේ යෙදීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන පහක් සඳහන් කරන්න.

(06) (i) මුස්ලිම්වරයෙකු තුළ දැකිය හැකි යහ ගුණාංග පිළිබඳ දක්වෙන සූරාවන් දෙකක් ලියන්න.

(ii) ඔබ තව්බා ඉටු කිරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි කුමක්ද?

(iii) වහී ගයිරු මත්ලුව්වු යනු කුමක් දැයි උදාහරණ හතරක් සමඟ පහදන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) උස්මාන් රළි තුමාගේ කාලයේ අල්කුර්ආනය ගොනු කිරීම.

(ii) අජ්නබි, මහ්රම් සීමාවන් රැකීම

(iii) සලාතයේ මෙලොව හා පරලොව ප්‍රයෝජන

(iv) ශාරීරික අභ්‍යාසයෙහි යෙදීම පිළිබඳ ඉස්ලාමීය මඟපෙන්වීම්

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

වර්ෂ අවසාන පරීක්ෂණය - 2020

ශ්‍රේණිය 10 විෂයය ඉස්ලාම් I කාලය පැය 01යි

## ලකුණු ක්‍රමය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 3 | 21 | 2 | 31 | 4 |
| 2 | 3 | 12 | 4 | 22 | 4 | 32 | 1 |
| 3 | 2 | 13 | 1 | 23 | 1 | 33 | 3 |
| 4 | 2 | 14 | 4 | 24 | 2 | 34 | 4 |
| 5 | 3 | 15 | 1 | 25 | 4 | 35 | 4 |
| 6 | 1 | 16 | 3 | 26 | 1 | 36 | 4 |
| 7 | 4 | 17 | 2 | 27 | 3 | 37 | 2 |
| 8 | 4 | 18 | 4 | 28 | 2 | 38 | 3 |
| 9 | 3 | 19 | 3 | 29 | 1 | 39 | 1 |
| 10 | 2 | 20 | 4 | 30 | 3 | 40 | 2 |

(1*40=40)

### 2 කොටස

1.

I. කදරිය්යා, ජබරිය්ය, මුර්ජිආ, uq#;is,d
II. සුළු කිල්ල, මහා කිල්ල
III. පරිහරණය කරන ලද ජලය (කුල්ලතයින් ප්‍රමාණයට වඩා අඩු ඉතා පිරිසිදු ජලය ෆර්ලු වන නෑම, වුලූ කිරීම වැනි ෆර්ලු වන වගකීම් උදෙසා භාවිතා කලේ නම් මෙම ජලය මෙසේ හඳුන්වයි.)
IV. අල්කුර්ආනය හා අස්සුන්නාහ්ව (කිතාබ් ආගම් - හික්මා - ඥානය)
V. දාරුල් ෆනා - විනාශ වන මෙලොව ජීවිතය
   දාරුල් බකා - නිමක් නොමැති පරලොව ජීවිතය
VI. ඉස්තිහ්සාන් , ඉස්තිස්ලාහ් , ඉස්තිස්හාබ් , උර්ෆ් , අෂ්ෂරාඉඋස් සාබිකා , කව්ලුස් සහාබි
VII. විශ්වාසය සම්බන්ධ හා ක්‍රියාකාරකම් සම්බන්ධ
VIII. බුද්ධිය සම්බන්ධ - කායික ශ්‍රමය
IX. නූහ් (අලෛ) තුමා
X. වහී මත්ලුව් - පාරායනා කර පෙන්වූ
   වහී හයිරු මත්ලුව් - පාරායන කර නොපෙන්වූ

(2*10=20)

2.

I. ඉබාදත් , ඉමාරත් , කිලාෆත්

II.

- සිත පාලනය කර දේව බිය බැතිය ඇති කර ගැනීම.
- අල්ලාහ් සමගින් බැඳීම් වර්ධනය කර ගැනීම.
- පාපී ක්‍රියාවන්ගෙන් වැළකී ජීවත් වීමට පුරුදු වීම.
- පරිත්‍යාගශීලීත්වය , ඉවසීම , අන්‍යයන්ට යහපත සැලසීම වැනි ගුණාංග වර්ධනය කර ගැනීම.
- දේව තෘප්තිය ලබා ස්වර්ගයට ඇතුළු වීමට මග පාද ගැනීම.
  (මෙවැනි කරුණු තුනක් ලියා ඇත්නම් ලකුණු 3)

III.

- ෂරීආවේ අනුමැතිය
- පිවිතුරු චේතනාව
- ෂරීආවේ සීමාව ඉක්මවා නොයෑම
- මූලික වතාවත් වලට අවහිර නොවීම
- නිවැරදිව හා පිළිවෙලට ඉටු කිරීම
  (මෙම කරුණු පහ ලියා කෙටියෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5)

(2+3+5= 10)

3.

I. තස්කියා යන අරාබි පදයේ තේරුම පාරිශුද්ධ කිරීම , පිළිවෙලට සකස් කිරීම වේ.
භාෂා ව්‍යවහාරයේ චිත්ත පාරිශුද්ධිය අර්ථය වන අතර තස්කියතුන් නෆ්ස් වේ.

II.

- අල්කුර්ආන් හා හදීස් අපට පෙන්වාදෙන මගපෙන්වීම් පිළිපැද ආටෝපය , ආඩම්බරකම , ඊර්ෂියාව වැනි පහත් ගුණාංග වලින් වැලකීම.
- ෆර්ලු වන වගකීම් නියමිත ආකාරයට ඉටු කිරීම
- සුන්නත් වන වතාවත් ඉටු කිරීම
- දික්ර් හි නියැළීම
- අල්කුර්ආනය පාරායනා කිරීම
- තව්බා කිරීම
  (මෙවැනි කරුණු තුනක් සඳහන් කර ඇත්නම් ලකුණු 3)

III. එක - නෆ්සුල් අම්මාරා බිස්සූඃ
අයහපතට පොළඹවන සිත. මෙය යහපත උදෙසා උත්සුක නොකරයි.

දෙක - නෆ්සුල් ලව්වාමා
තමාවම රිදවාගන්නා සිත. හැඟීම් උත්සන්නවී අකුසෙහි නියැලුනේ නම් ඒ වෙනුවෙන් සිතින් පසුතැවිලි වේ.

තුන - නෆ්සුල් මුත්මඉන්නා
තෘප්තිමත් සිත. කලබලයෙන් හා නොසන්සුන් බවින් තොර තැන්පත් තත්වයක් දක්නට ලැබේ. යහපත කෙරෙහි ඇති පොළඹවීම් අධික වශයෙන් දක්නට ලැබේ.
(තුනම ලියා විස්තර කර ඇත්නම් ලකුණු 5)

(2+3+5=10)

4.

I. මුහම්මද් නබි (සල්) තුමාගේ ජීවිත කථාව

II.

- හරාම් වූ දෑ අඩංගු භාණ්ඩයක් නොවිය යුතුයි.
  (උදා: මධ්‍යසාර)
- හරාම් වූ ක්‍රියා මගින් ලබා ගත් දෙයක් නොවිය යුතුයි.
  (උදා: පොළිය , අල්ලස)
- ජනතාවට හිරිහැරයක් හෝ රැවටීමක් වන දෙයක් නොවිය යුතුයි.
  (උදා: සඟවා තැබීම් )
- පොදු නීති උල්ලංඝනය කිරීමේ ක්‍රියාවක් නොවිය. යුතුයි
  (උදා: කළු කඩ , භාණ්ඩ පැන්නීම)
- යහපත් සාරධර්ම වලට පටහැනි නොවිය යුතුයි.
  (උදා: බොරු , වංචාව)
  (මෙවැනි කරුණු තුනක් ලියා ඇත්නම් ලකුණු 3)

III.

- දේව ගුණාංග
- කිසි කෙනෙකුට අසාධාරණයක් නොවීම
- නම්‍යශීලීභාවය
- සමාජය තුල පැන නගින ආර්ථික උස් පහත්කම් විධිමත් කිරීම
- සමාජ යහපත හා පෞද්ගලික යහපත අතර සම්බන්ධතාවක්ඇති කිරීම
- අධ්‍යාත්මික අවශ්‍යතා සහ ලෞකික අවශ්‍යතා ගැන සමව සැලකිල්ලට යොමු කිරීම.
  (මෙවැනි කරුණු පහක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු 5)

(2+3+5=10)

5.

I. දුල්කර්නයින් රජු

II.

- ගැනුම්කරු , විකුණුම්කරු
- වෙළඳ භාණ්ඩ
- ඊජාබ් - කබුල්

III.

- ඔවුන්ගේ ගනුදෙනු ක්‍රියාවලිය නැමදුමක් බවට පත් වේ.
- මිලදී ගන්නා හා විකුණන්නා අතර සුහදතාවක් ඇතිවේ.
- වෙළඳාමේ ස්ථාවරත්වයක් ඇතිවේ.
- අනවශ්‍ය දෝෂාරෝපණ වලින් ආරක්ෂාව ලැබේ.
- හරාම් වන ගනු දෙනු වලින් මිදිය හැක.
  (මෙවැනි කරුණු පහක් ලියා ඇත්නම් ලකුණු 5)

(2+3+5=10)

6.

I. සූරා ලුක්මාන් , සූරා ෆුර්කාන්

II.

- අල්ලාහ් වෙතය යන පිරිසිදු චේතනාවෙන් තව්බා කිරීම.
- තමා කල පාප අතහැර එයින් සහමුලින්ම ඉවත් වීම.
- පෙර කල ඒ පාපය නැවතත් නොකරමි යනුවෙන් ප්‍රතිඥා දීම.
- කරන ලද පාපය මිනිසා හා සම්බන්ධ වන්නේ නම් ඔහුගෙන් සමාව ඉල්ලා පසුව අල්ලහ්ගෙන් සමාව අයැදීම.

III. වහී ගෛරු මත්ලුව් යනු පාරයනා කර නොපෙන්වූ වහී වේ. මෙය විවිධ ආකාරයෙන් දේව ධර්ම දූතයන්ට හිමි වේ. උදාහරණ ලෙස ඉබ්‍රාහිම් (අලෛ) තම පුත් ඉස්මායිල් (අලෛ) තුමාව කුර්බාන් කරන ලෙස සත්‍ය සිහිනයක් දුටුවේය. එවැනි සත්‍ය සිහින මෙහි අන්තර්ගතවේ. එසේ ම මූසා (අලෛ) තුමා තූර්සිනා කන්ද අසලින් යන විට හඬක් ඇසීම. zසකරියියා (අලෛ) තුමා තම සමාජයට සංඥා මගින් අල්ලාහ් නැමදීමටද ප්‍රශංසා කිරීමටද ඉගැන්වූයේය. මුහම්මද් (සල්) තුමාණන්ගේ හදීස් නැතහොත් සුන්නා.

(2+3+5=10)

7.

I. උස්මාන් රලි තුමාගේ කාලයේ අල්කුර්ආනය ගොනු කිරීම

අල්කුර්ආනය ගොනු කිරීමේ ඊළඟ පියවර , කලීෆා උස්මාන් රලි තුමාගේ කාලයේ සිදුවිය. එතුමාගේ කාලයේ අර්මේනියාව , අසර් බයිජාන් යන ප්‍රදේශවල මුස්ලිම් ජාතිකයෝ සටන් වල නිරත වෙමින් සිටියහ. ඔවුහු අල්කුර්ආනය පාරයනා කරන විට විවිධාකාරයෙන් පාරයනා කළහ. එපමණක් නොව තම පාරායන රටාව නිවැරදි යැයි තර්ක කළහ. මෙය හුදෙයිෆා අල් යමානි (රලි) තුමා අවධාරණය කළහ. කලීෆා තුමා වහාම ක්‍රියාත්මක විය. සයිද් බින් තාබිත් (රලි) තුමාගේ නායකත්වය යටතේ කුරෛෂ්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කළේය. කලීෆා තුමා ඔවුන්ගෙන් කුරෛෂ්වරුන්ගේ උච්චාරණය අවධානයට ලක් කරමින් පිටපත් අටක් සකස් කළහ. ඒවා එක් එක් පළාත් වලට යවනු ලැබුණි. එම පිටපත් සමග කුරෛෂ්වරුන්ගේ ව්‍යවහාරයට පාරයනා කල හැකි කාරිවරුන්ද යැව්වේය. එම කාරිවරුන් සේ පාරායානා කිරීමට උපදෙස් දෙනු ලැබුණි. අනෙක් පිටපත් සියල්ල ගිනිබත් කල යුතුය යන්නත් අණ කළේය.මේ නිසා සියලු දෙනාව අල්කුර්ආනය එකම ආකාරයට පාරයනා කරන තත්වයක් ඇතිවිය. මේ නිසා උස්මාන් රලි තුමා ''ජාමිඋල් කුර්ආන්'' යනුවෙන් හඳුන්වනු ලැබීය.

II. අජ්නබි මහ්රම්

පවුලේ නෑකම හේතුවෙන් නැත්නම් විවාහක නෑකම නැතහොත් කිරි නෑකම හේතුවෙන් එක් ස්ත්‍රීයකුට හෝ පුරුෂයකුට ස්ථිරව විවාහ වීමට තහනම් වූ පුරුෂය හෝ ස්ත්‍රීය මහ්රම් ලෙස හැඳින්වේ. විවාහ වීමට අනුමැතිය ලත් අය අජ්නබි වේ.

අජ්නබි වූ අය සමග ආශ්‍රය කිරීමේදී අනුගමනය කල යුතු කරුණු බැල්ම පාලනය කර ගැනීම , කාන්තාව අව්රතය සම්පූර්ණයෙන් වැසීම , ඇවිදීම ඇඳුම් ඇඳීම , හැසිරීම හා කතා කිරීම පිළිපැදීම , පිරිමින්ගේ හැඟීම් ඇවිස්සෙන ක්‍රියාවල නොදීම, ස්ත්‍රී පුරුෂ හුදකලා වීමට ඇති අවස්ථා සීමා කිරීම.

III. සලාතයේ මෙලොව හා පරලොව ප්‍රයෝජන

අල්ලාහ් සමග සංවාදයේ යෙදීම,අල්ලාහ් සිහිපත් කිරීම හා සැනසුම , දේව දයාව , ස්වර්ගයේ යතුර, පරාර්ථකාමී හැඟීම හා නොසැලෙන සිත, පාපීක්රියාවන්ගෙන් ආරක්ෂාව , පව් කමාව ලැබීම,පරමාන්ත දිනයේ සාක්ෂියක් වීම , බාහිර අභ්‍යන්තර පිරිසිදුකම, නිරයේ වේදනාවෙන් ආරක්ෂාව.

IV. ශාරීරික අභ්‍යාස

ශරීරය නියමිත මට්ටම තුල තබා ගැනීම ඉබාදත් වේ. යහපත් ශරීර සෞඛ්‍යයට ශාරීරික අභ්‍යාස අතිශයින් වැදගත්වේ. ශාරීරික අභ්‍යාසවල නිරත වීම ඉස්ලාම් දැඩි ලෙස උනන්දු කර ඇත. දරුවන්ට පිහිනීමටත්, දුනු විදීමටත් , අශ්වයා පිට සවාරි යාමටත්, උගන්වන්න යැයි නබි සල් තුමා අවධාරණය කළේය.

(5+5=10)

මුළු ලකුණු
I කොටස = 40
II කොටස = 60
මුළු ලකුණු = 100